# කුට්ටම් පොකුණ



# සිහින කොදෙව්වේ සිංදු කියන මාළුවෝ

ලක්ෂ්මන් කොඩිතුවක්කු

මෙලෝතලයේ දේශපාලන පොළවමත වැඩිම කලාබර දේශපාලඥයන් පිරිසක් සිටින රට කුමක්දැයි කවුරුන් හෝ ඇසුවොත් එයට ලබා දිය යුතු එකම පිළිතුර වන්නේ ශ්‍රී ලංකාවයි. ශ්‍රී ලංකාවේ තරම (Size) අනුව වැඩිම මන්ත්‍රීවරු, ඇමතිවරු,දේශපාලන පක්ෂ ඇතුළු රටවටේ යමින් ජනතාව පිනවන හෝ රිදවන, සිංදු කියන රඟන මන්ත්‍රීවරු පිරිසක් සිටින අපිට සහ රටේ ජනතාවට කලාකාරයා දේශපාලඥයෙක් විය යුතුද නැත්නම් දේශපාලඥයා කලාකාරයෙක් විය යුතුද යන්න තරමටම පිටපොට පැටලී ඇත. අහස උසට ජනතා ප්‍රශ්න ගොඩවූ රටකට ඒ සියලු ප්‍රශ්න අමතක කොට ඒ කාලය සංගීත සන්දර්ශනවල සහ මෙගා ඩෙගා ස්ටාර්වලට වැයකරන දේශපාලඥයන් පිරිසක් සිටින රටකට ඇත්තේ දෙයියන්ගේ පිහිට පමණි. ජනතා ප්‍රශ්න විසඳන්නට සිටින මර්වින් සිල්වා, රෝසි, දයාසිරි, පබා, රන්ජන් ආදීන් සියල්ල දැන් ජනතාවගේ මෙගා ප්‍රශ්න විසඳන්නට සැහැදී පැහැදී සිටිති. මේ සියලු දෙනා දැන් වැඩි කාලයක් ගත කරන්නේ රූපවාහිනී චැනල් තුළය. මර්වින් සිල්වාට දැන් අමාත්‍යංශයේ ප්‍රශ්න නැත. තිබුණු ප්‍රශ්නත් දැන් ඔහු සමෘද්ධිලාභියා ගස් බැඳ අවසන් කළේය. මෙගාස්ටාර් වේදිකාව දැන් ඔහුට පාර්ලිමේන්තු වේදිකාවක් සේමය.



මෑතකදී ජනතාව පිනවන්නට වේදිකාවට ගොඩ බැස්ස නවතම දේශපාලන ගායකයා වූයේ විමල් වීරවංශයි. ඔහු දැන් නිවාස අමාත්‍යංශයට වඩා ජනතාව ප්‍රිය කරන අමාත්‍යංශයක් තෝරා ගැනීමට උත්සහ දරයි. විමල් සිංදු කිව්වාට අපිට කම් නැත. ඒත් විමල්ගේ සිංදු අහන්නට සංගීත සංදර්ශනවලට එන්නේ නිවසට වහලක් නැති නැත්නම් හරිහමන් හිතට නිවනක් නැති මිනිස්සුය. එම ජනතාවට අතීතය අමතක කරවන්නට විමල්ට නොහැකි බව ඔහු කදිමට කියාපෑවේ මෑතකදී ඔහු විජයකුමාරණතුංග නැමැති ජනප්‍රිය කලාකරුවා සමඟ සරත් ෆොන්සේකා සංසන්ධනය කරන්නට යෑමෙනි. දේශපාලනය ගීතයක් සේම මිහිරි නැත. එයට හරිහමන් තාලයක්ද නැත. නමුත් එයට වැළලිය නොහැකි අතීතයක් ඇත. ඔහු කියන්නේ එදා චන්ද්‍රිකා ජේ ආර් ළඟට ගොස් සමාව ගත්තා සේම, මෙදා සරත් ෆොන්සේකාගේ බිරිඳ අනෝමා, ජනාධිපතිවරයා හමුවී සැමියා වෙනුවෙන් සමාව ගතයුතු බවයි. මා හට මෙහිදී මතක් වන්නේ විජය කුමාරණතුංග ගැයූ -දඟ ගෙයි සියමැලි වැඩිනම් අළුගෝසුවනේ මා එල්ලාපන්" කියායි. එදා විජය කුමාරණතුංග නැක්සලයිට් චෝදනාව යටතේ රජය පෙරළීමට මාන බැලූ කුමන්ත්‍රණකරුවෙකු ලෙස හංවඩු ගසා අත් අඩංගුවට ගත්තේ කිසිදු සාධාරණ චෝදනාවක් නොමැතිවය. විජයට සේම, වාසුට සහ රෝහණ විජේවීරට එල්ල කළ චෝදනා ද එකල රජයට කිසිසේත්ම ඔප්පුකර ගැනීමට නොහැකිවිය.

එහෙත් අද සරත් ෆොන්සේකාට එසේ විය හැකිද ? යුද්ධිකරණය මගින් ඔහු වැරදිකරුවකු කර හමාරය. ඔහුට ඇති එක චෝදනාවක් වන්නේ ටෙන්ඩර් මගඩියයි. එසේනම් ජනාධිපතිවරයාගේ පෑන් පාරින් අනුමත කළ එම තීරණය, විජය කුමාරණතුංගගේ ප්‍රශ්නය හා සමගාමීව දැකීමට තරම් විමල් බාල බොළඳයෙක් වී ඇත. දූෂිතයන් මහා ප්‍රමාණයක් නිදැල්ලේ සිටින රටක, සරත් ෆොන්සේකා අතුලේ සිටීම වෙනම කතාවකි. එසේනම් මීට පෙර යුද්ධිකාරණය මඟින් වැරදිකරුවන් වූ සාමන්‍ය සෙබළා ද සමාව දීමට මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා එක තීරණයක් ගත යුතුය. ඔවුන්ගේ බිරින්දෑවරුන් සහ දරු-වන්ටද ජනාධිපතිවරයා හමුවී සමාවක් ගැනීමට අවකාශයක් විමල් විරවංශ සදා දිය යුතුය.

අද සරත් ෆොන්සේකා ස්ත්‍රී දූෂකයෙකි. සල්ලාලයෙකි. රාජ්‍ය දේපළ මංකොල්ල කාගේත් මගඩියෙකි. තද සැරපරුෂ ගති ලක්ෂණ ඇත්තෙකි. එහෙත් මේ සියල්ල තිබුණේ ඔහු හමුදාපති වන්නට පෙරය. ජනාධිපතිවරයා හමුදාපති කළේ එවැනි පුද්ගලයෙකි. සමහරවිට යුද්ධය දිනාගන්නට නම් එවැනි පුද්ගලයෙකු අවශ්‍යදැයි ජනාධිපතිවරයා කල්පනා කරන්නට ඇත. එහෙත් මේ සියල්ල කණපිට පෙරළී එළියට ආවේ ඔහු විරුද්ධ දේශපාලනයක් කළ නිසාය. එසේ නොකළානම් ඔහු අදටත් වීරයෙකි. අභිමානවත් රණවිරුවෙකි.

සරත් ෆොන්සේකාට බලය නොදීමට ජනතාව ගත් තීරණය මම අදද සීයට සියක් අනුමත කරමි. එවැනි පුද්ගලයෙකුට බලය ලැබුණානම් වෙන අලකලංචිය ඔබ අප කවුරුත් දන්නා දෙයකි. නමුත් ඔහු වගේම තවත් බොහෝ දූෂිතයන් පිරිසක් ජනතාව පාර්ලිමේන්තුවට යවා ඇත. රජවරුන් සමඟ කිරිපැණි කෑමේදී දැලිපිහියෙන් කෑ යුතුය. කිරිපැණි හැන්දෙන් කනවාට රජතුමා ප්‍රිය නැත. සරත් ෆොන්සේකාද දැලි පිහියෙන් කිරිපැණි කෑමට ගොස් කට කපාගත් නායකයෙක් වී හමාරය. විමල් වීරවංශද ඒ බව දැනගත යුතුය. නැත්නම් බෑන් කී මූන්ට විරුද්ධව උපවාස කර ජනාධිපතිවරයා අවුත් පෙවූ වතුර වීදුරුව තව ටික කලකින් වස විදුරුවක් වියහැක.

අද සරත් ෆොන්සේකා වෙනුවෙන් එක එල්ලේ හඬක් නැගීමට සිටින්නේ මාදුළුවාවේ සෝභිත හිමි පමණි. ජේවීපිය සහ යූඇන්පී නැගූ හඬ අද පුස්සක් වී හමාරය. ඇත්තෙන්ම අද යූඇන්පීයේ රනිල් වික්‍රමසිංහ ඒ වෙනුවෙන් කිඹුල් කඳුළු හෙලන්නේ සරත් ෆොන්සේකා නිවැරදිකරුවෙකු නිසා නොවේ. සරත් ෆොන්සේකා දේශපාලනයට කැන්දාගෙන වුත් ඔය මඟට ඇද දැම්මේ ඔවුන් නිසාය. ජනතා මනාපයක් නැති යුධ හමුදා නායකයකු දේශපාලනයට කැන්දාගෙන ඒමේදී රටට කිනම් ප්‍රතිඵලයක් අත්වේදැයි රනිල් වැනි ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන නායකයකු හොඳින් සිතා බැලිය යුතුය.

*පවතින රජයට තව වසර හතක කාල පරාසයක් තිබේ. මේ වසර හතක කාලයතුළ රජය වෙනස් කිරීමට කිසිවෙකුට නොහැකිය. එහෙත් හරි දේ නොකළ හොත් ලැබෙන ජනප්‍රිය භාවය හා ඡන්ද ප්‍රතිශතය පහළ බසින බව රජය දනී.*

ඇමතිකමක්ද ලැබෙනවා නොඅනුමා-නය.

එවැනි බොහෝ දෙනෙක් අද රජය සමඟ සිටී. එසේම ගී කියන්නට නොහැකි වුවත් ඇමතිවරු සේම ඔහුටද ගායකයෙක් විය හැක. ටෙන්ඩර්, සුදු කොඩි සියල්ල ජයකොඩි වනු ඇත. ඔබට ඒ වෙනුවෙන් ජනාධිපති හමුවී දැනුම් දෙන්නට හැකි කාලයක් එනතුරු එයින් එලවැල

තිබේ. මේ වසර හතක කාලයතුළ රජය වෙනස් කිරීමට කිසිවෙකුට නොහැකිය. එහෙත් හරි දේ නොකළ හොත් ලැබෙන ජනප්‍රිය භාවය හා ඡන්ද ප්‍රතිශතය පහළ බසින බව රජය දනී. දැනටනම් රජයේ විපක්ෂයේ ජනප්‍රියභාවය පහළ වැටී ඇති බව සමීක්ෂණයක් මඟින් පෙන්වා දී ඇත. විපක්ෂයේ ජනප්‍රියභාවය ඊටත් වඩා පහළ වැටී ඇති නිසා රජයට මේ වසර හත ඇදගෙන යා හැක. එතෙක් සියලු මැති ඇමතිවරුන්ට සේම විපක්ෂයටද ගී කියමින් රටවටේ යා හැක. මේ වගේ රටවටේ යමින් විනෝද විය හැක්කේ යුද්ධය නිමාකළ නිසා බව ඔවුන්ට වේදිකාවේ පුන පුනා කිව හැක. දැන් සරත් ෆොන්සේකාට කළ හැක්කේ තම කුටියේ සවි කරගත් රූපවාහිනී යන්ත්‍රය තුළින් මේවා බලමින් අත් පුඩි සැලීම පමණි. නැත්නම් අනෝමාගේ මොබිටෙලයෙන් ඔවුන්ට එස් එම් එස් යැවීම පමණි.

පිල්ලෙයාන්ට කරුණාට දයාමාස්ටර්ලාට සමාව දීමට හැකිනම්, ඔවුන්ට මේ රටේ ජනතා දේශපාලනය කළ හැකි නම් ඇයි ෆොන්සේකා මහත්තයට එසේ කළ නොහැකි යන, මාදුළුවාවේ සෝභිත හිමි නගන තර්කයට සාධාරණ පදනමක් ඇත. එහෙත් හාමුදුරුවනේ අද කරුණාලා පිල්ලෙයාන්ලා සිටින්නේ රජය සමඟය. සරත් ෆොන්සේකාද එසේ වෙනවා නම් ඔහුට අද ලැබී ඇති ද්‍රෝහී නම්බුනාම සියල්ල කණපිට පෙරළීම වීරයෙකු බවට පත්වී

නෙලන්නට සිටින විරුද්ධ පාක්ෂිකයන්ට අත්වෙන ඡන්ද වාසිය වැඩිය. එසේ වුවහොත් විමල් වීරවංශගේ නිවාස ඇමතිකම ඔහුට ලැබෙනවා නොඅනුමානය. දේශපාලනය යනු එයයි. ඒ බව ඔහු වෙනුවෙන් කථා කරන සෝභිත හිමියන්වත් සරත් ෆොන්සේකාවත් හරි හැටි දන්නේ නැත. මෑතකාලයේ ඒ බව දැනගත් එකම දේශපාලඥයා මර්වින් සිල්වා පමණි.

පවතින රජයට තව වසර හතක කාල පරාසයක්

එහෙයින් දැන් අප රටේ ගී ගයමින් විනෝදවෙන සියලුම දේශපාලඥයන් ජනසන්ධ ජාතකයේ මෙන් මිනිසුන්ට පසුතැවීමට සිදුවන සියලු කාරණාවලින් මිදී පරිපූර්ණ මිනිසුන් වී හමාරය. එයින් අසම්පූර්ණ මිනිසා වී ඇත්තේ සරත් ෆොන්සේකා පමණි. එහෙයින් ඔහු හිරගෙදර තපයි. සමාව ගතහොත් ඔහුටද එයින් මිදය හැක. සමාව දුනහොත් ජනාධිපතිවරයාට ඒ කාරණාවලට ඇතුළත් විය හැකි ය.

